# Mahaweli Authority of Sri Lanka
# Calling for Aspirations for Leasing of Mahaweli Lands for Agricultural Animal Husbandry Related Industrial Investment Projects
## Instructions and Terms

1. According to the newspaper advertisement published in the national newspapers on 27.10.2020, investors will be registered from 28/10/2020 to 27/11/2020 to call for aspirations for leasing Mahaweli lands for agricultural, animal husbandry and allied industries, investment projects.

2. Obtaining the relevant application form to apply for the project requested, a non-refundable amount of Rs.2000.00 should pay to the account number 2327543 at Bank of Ceylon, Hyde Park Branch in the name of Director General, Mahaweli Authority of Sri Lanka and the receipt of payment should be sent to the e- mail, maslheadofficebd@gmail.com on or before 27/11/2020 stating your name, address, telephone number, the project being applied for, the Mahaweli System required to obtain the land and the number of lots of land applied for.

3. A non-refundable amount of Rs. 2000.00 per lots of land should be paid for the registration for the field inspection and it is mandatory to make separate payments for each lots of land requested.

4. After paying the amount on the due date and sending the relevant receipt to the email address maslheadofficebd@gmail.com, the due dates for the field inspection for the registered investors will be published on 29/11/2020 in the official website of the Mahaweli Authority (www.mahaweli .gov .lk).

5. Details of proposed lots of land for projects are also available on this website.

6. After the field inspection, the duly completed application form, the project report and the copy of the payment receipt should be sent to Director General, Mahaweli Authority of Sri Lanka, No. 500, T.B. Jaya Mawatha, Colombo 10. on or before 2.00 pm on 31.12.2020, by registered post.(Annexure 01 provides guidance on preparation of project report)

7. In the left corner of the envelope containing the application form and project report should be mentioned as “Acquisition of Mahaweli Lands for Agricultural and Animal Husbandry Industrial Investment Projects -…. Zone ".

8. All applications submitted before 31.12.2020 will be evaluated by the Investment Project Evaluation Committee according to formal criteria (investor's financial viability, economic significance of the proposed project, economic benefits of the project, use of new technology and project eco-friendly methodology etc.) and Suitable investors will be selected for the relevant lots of land.
   (Details of other documents to be submitted are given in Annexure 01)

9. Following the selection of suitable investors for the relevant lands by the Investment Project Evaluation Committee, necessary action will be taken to award the land to the relevant person or institution on the basis of long term lease for a period of 30 years subject to the provisions of the State Land Ordinance.

10. A tax of 4% of the assessed value of the relevant land is levied annually for the land to be given. This annual tax is increased by 20% in every 5 years.

11. At the time of allotment of the land, a Performance Bond of 2% of the nominal valuation value of the land should be issued in the name of the Director General, Mahaweli Authority of Sri Lanka.

12. Within one year of the acquisition of the land, the development of the land should be carried out to the satisfaction of the Residential Project Manager of the relevant zone, and in cases where it has not been developed, the deposit will be credited to the National Income. It is possible to reimburse the relevant deposit for the lease amount when the development of the land has been done within a year.

Eng. B.A. Sunil S. Perera
Director General
Mahaweli Authority of Sri Lanka

Annexure 01

## Documents to be submitted by land applicants when allotting land for investment projects on long term lease basis by Mahaweli authority of Sri Lanka

**01. Project proposal.**

- Introduction / Profile of the company
- Introduction of the Project
  - I. Objectives of the company
  - II. Social and Economic benefits of the project
- Marketing plan.
  - I. Market analysis (Local / Foreign)
  - II. Export

  (If the project is export orient project, expected export countries and export volume should be mentioned clearly)
- Management plan
- Operational / Production plan
  - I. New technology
  - II. Activity plan of the project
- Financial plan
  - I. Funding method of the project
  - II. Project cost
  - III. Expected financial plan for next 3 years (Final accounts)
- Environment impact of the project

**02. Bank statement which proved the financial capability of the investor.**

I. (15% - 20% of the total investment of the project should be proved by the statement and the source of the balance fund should be mentioned Cleary).

II. If foreign fund is expected to use for the project, Investment fund transaction shall be made through an inward investment account (IIA) – (Foreign Exchange Act, No.12 of 2017 Banker of the investment should prove the above matter)

**03. If the investor is a company following documents should be submitted.**

I. Business Registration, of the company (BR)

II. Composition of the company director's / Share holders (From 01/ From 20)

**ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය**
**කෘෂිකාර්මික සත්ව පාලන ආශ්‍රිත කර්මාන්ත ආයෝජන ව්‍යාපෘති සඳහා මහවැලි ඉඩම් බදු දීම සඳහා අභිලාශයන් කැඳවීම**
**උපදෙස් හා කොන්දේසි මාලාව**

1. 2020.10.27 වන දින ජාතික පුවත්පත්වල පලවූ පුවත්පත් දැන්වීම පරිදි කෘෂිකාර්මික , සත්ව පාලන සහ ආශ්‍රිත කර්මාන්ත, ආයෝජන ව්‍යාපෘති සඳහා මහවැලි ඉඩම් බදුදීම පිණිස අභිලාශයන් කැඳවීම සඳහා 2020/10/28 වන දින සිට 2020/11/27 වන දින දක්වා ආයෝජකයින් ලියාපදිංචි කරගනු ලැබේ.

2. ආයෝජන ඉඩම් ඉල්ලුම් කරනු ලබන ව්‍යාපෘතිය සඳහා අයදුම් කිරීමට අදාල අයදුම්පත්‍රය ලබා ගැනීම අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය නමින් ලංකා බැංකුව, හයිඩ්පාර්ක් ශාඛාවේ 2327543 දරන ගිණුම් අංකයට රු.2000ක ආපසු නොගෙවන මුදලක් බැර කර, අදාල ලදුපත maslheadofficebd@gmail.com යන විද්‍යුත් තැපැල් ලිපිනයට 2020/11/27 වන දින හෝ ඊට පෙර ඔබගේ නම, ලිපිනය, දුරකථන අංකය , ඉල්ලුම් කරන ව්‍යාපෘතිය හා ඉඩම ලබා ගැනීමට අවශ්‍ය මහවැලි කලාපය සහ ඉල්ලුම් කරනු ලබන ඉඩම් කට්ටි ගණන ද සඳහන් කර එවිය යුතුය.

3. එක් ඉඩම් කට්ටියක් සඳහා ආපසු නොගෙවන රු.2000.00 ක මුදලක් ගෙවා ක්ෂේත්‍ර පරීක්ෂාව සඳහා ලියාපදිංචි විය යුතු අතර ඉල්ලුම් කරනු ලබන එක් එක් ඉඩම් කට්ටි සඳහා වෙන වෙනම ගෙවීම් සිදු කිරීම අනිවාර්ය වේ.

4. නියමිත දිනට පෙර මුදල් ගෙවා අදාල ලදුපත maslheadofficebd@gmail.com යන විද්‍යුත් ලිපිනයට යොමුකළ පසුව, ලියාපදිංචි කරනු ලබන ආයෝජකයින් සඳහා ක්ෂේත්‍ර පරික්ෂාව සඳහා නියමිත දිනයන් 2020/11/29 වන දින ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නිල වෙබ් අඩවියෙහි (www.mahaweli .gov.lk ) පලකරනු ලැබේ.

5. ව්‍යාපෘති සඳහා යෝජිත ඉඩම් කට්ටි පිලිබඳ විස්තර ද මෙම වෙබ් අඩවියෙන් ලබා ගත හැක .

6. ක්ෂේත්‍ර පරික්ෂාවට පසුව නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය සහ විධිමත්ව සකසන ලද ව්‍යාපෘති වාර්තාව සහ මුදල් ගෙවූ ලදු පතේ පිටපත 2020.12.31 දින ප.ව.2.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, නො.500, ටී.බී. ජායා මාවත, කොළඹ 10 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කල යුතුය. (ඇමුණුම 01 මගින් ව්‍යාපෘති වාර්තාව සැකසීම සම්බන්ධව මාර්ගෝපදේශයක් සපයා ඇත)

7. අයදුම්පත්‍රය සහ ව්‍යාපෘති වාර්තාව බහාලන කවරයේ වම් පස කෙලවර " කෘෂිකාර්මික, සත්ව පාලන ආශ්‍රිත කර්මාන්ත ආයෝජන ව්‍යාපෘති සඳහා මහවැලි ඉඩම් ලබා ගැනීම - …. කලාපය" ලෙස සඳහන් කල යුතුය.

8. 2020.12.31 දිනට පෙර යොමු කරන ලද සියලුම අයදුම්පත් ආයෝජන ව්‍යාපෘති ඇගයීම් කමිටුවට ඉදිරිපත් කර විධිමත් නිර්ණායකයන්ට අනුව සලකා බලා (ආයෝජකයාගේ මූල්‍ය හැකියාව, යෝජිත ව්‍යාපෘතියේ කාලීන වශයෙන් ඇති වැදගත්කම, ව්‍යාපෘතියේ ආර්ථික ප්‍රතිලාභ, නව තාක්ෂණ භාවිතය හා ව්‍යාපෘතිය පරිසර හිතකාමී ක්‍රමවේදයට අනුව සිදුකිරීම යන නිර්නායකයන්) අදාල ඉඩම් කොටස් සඳහා සුදුසු ආයෝජකයින් තෝරා ගනු ලැබේ.
(ඉදිරිපත් කළ යුතු අනෙකුත් ලිපි ලේඛන පිළිබඳ විස්තර ඇමුණුම 01 මගින් දක්වා ඇත)

9. ආයෝජන ව්‍යාපෘති ඇගයීම් කමිටුව විසින් අදාල ඉඩම් සඳහා සුදුසු ආයෝජකයින් තෝරා ගැනීමෙන් අනතුරුව රජයේ ඉඩම් ආඥා පනතේ විධිවිධානයන්ට යටත්ව අදාල පුද්ගලයා හෝ ආයතනය වෙත වසර 30 ක කාලයක් සඳහා දීර්ඝ කාලීන බදු පදනම මත ලබා දීමට කටයුතු කෙරේ.

10. ලබා දෙනු ලබන ඉඩම සඳහා අදාල ඉඩමේ රජයේ තක්සේරු වටිනාකමින් 4% ක බද්දක් වාර්ෂිකව අය කෙරේ. මෙම වාර්ෂික බදු මුදල වසර 5කට වරක් 20% කින් වැඩි කිරීම සිදු වේ.

11. ඉඩම ලබා දෙනු ලබන අවස්ථාවේ ඉඩමෙහි නාමික තක්සේරු වටිනාකමින් 2% ක අගයකින් යුත් කාර්යසාධන බැඳුම්කරයක් (Performance Bond) අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය නමින් ලබා දිය යුතුය.

12. ඉඩම ලබා ගෙන වර්ෂයක් තුල අදාල කලාපයේ නේවාසික ව්‍යාපාර කළමණාකාරවරයා සෑහීමකට පත්වන අයුරින් ඉඩමේ සංවර්ධන කටයුතු සිදු කල යුතු අතර, එසේ සංවර්ධනය කර නොමැති අවස්ථාවන්හිදී තැන්පතු මුදල ජාතික ආදායමට බැර කරනු ලැබේ. ඉඩමේ සංවර්ධනය වර්ෂයක් තුල සිදු කර ඇති අවසථාවන් වල බදු මුදල සඳහා අදාල තැන්පතු මුදල හිලව් කිරීමේ හැකියාව ඇත.

ඉංජි. බී.ඒ.සුනිල් එස් පෙරේරා
අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

**ඇමුණුම 01**

<u>ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් දීර්ඝ කාලීන පදනම මත ආයෝජන ව්‍යාපෘති සඳහා ඉඩම් ලබාදීමේදී ඉඩම් ඉල්ලුම්කරුවන් විසින් ඉදිරිපත් කළ යුතු ලේඛණ</u>

**01. විධිමත්ව සකස් කරන ලද ව්‍යාපෘති වාර්තාව**

- ආයෝජකයා/ආයතනය පිළිබඳ හැඳින්වීම
- ව්‍යාපෘතිය පිළිබඳ හැඳින්වීම
  - I. ව්‍යාපෘතියේ අරමුණ
  - II. සමාජ ආර්ථික ප්‍රතිලාභ
- වෙළඳපළ විශ්ලේෂණය (දේශීය/විදේශීය)/අලෙවිකරණ සැලැස්ම.
  (විදේශීය වෙළඳපල පදනම් කරගත් නිෂ්පාදනයක්නම් අපනයනය කරනු ලබන රටවල් සහ ආයෝජන අපනයන පරිමාව පැහැදිලිව සඳහන් කල යුතුය.)
- අපේක්ෂිත කළමනාකරණ සැලැස්ම
- මෙහෙයුම් සැලැස්ම/නිෂ්පාදන සැලැස්ම.
  (නව නිෂ්පාදන ක්‍රමවේද/තාක්ෂණික භාවිතය)/(ව්‍යාපෘතියෙහි ක්‍රියාත්මක සැලැස්ම අනිවර්යෙන් ඉදිරිපත් කළ යුතුය)
- මූල්‍ය සැලැස්ම
  - I. ව්‍යාපෘතිය සඳහා අරමුදල් යොදා ගන්නා ආකාරය
  - II. ව්‍යාපෘති පිරිවැය
  - III. ඉදිරි වර්ෂ 03 සඳහා අපේක්ෂිත මූල්‍ය සැලැස්ම
- ව්‍යාපෘතියේ පාරිසරික බලපෑම් පිළිබඳව

02. ආයෝජකයාගේ මූල්‍ය හැකියාව තහවුරුකරන බැංකු ප්‍රකාශන

I. (ව්‍යාපෘතියේ මුළු ආයෝජනයෙන් 15% -20% අතර මූල්‍ය හැකියාවක් බැංකු ප්‍රකාශන මගින් තහවුරුකළ යුතු අතර, ඉතිරි අරමුදල සපයා ගන්නා ආකාරය පැහැදිලිව ඉදිරිපත්කළ යුතුය)

II.ව්‍යාපාතිය සඳහා විදේශීය මුදල් ආයෝජනය කරන්නේනම් අපේක්ෂිත ප්‍රමුඛ ආයෝජන ගිණුමක් (IIA) හරහා ගෙනආ බව ආයතනයේ බැංකුකරු විසින් තහවුරුකළ යුතුය.

- ආයෝජකයා සමාගමක්නම් පහත ලේඛණ ලබාදිය යුතුය.
  I.සමාගම් ලියාපදිංචි කිරීමේ සහතිකය (BR)
  II.සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය (Form 1/Form 20)